245
1


මගේ අංකය / எனது இல. / My No. } RG/FB/02/B.Assit/ආදායම රැස් කිරීම

ඔබේ අංකය / உமது இல. / Your No. }

දුරකථන අංක / தொலைபேசி இல. / Telephone Nos. } 2889488, 2889489

ෆැක්ස් අංකය / தொலைநகல் / Fax No. } 2889491

ඊ මේල් / மின்னஞ்சல் / E-mail } rgd@sltnet.lk, rg@rgd.gov.lk


# රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව
# பதிவாளர் நாயகம் திணைக்களம்
# REGISTRAR-GENERAL'S DEPARTMENT

ප්‍රධාන කාර්යාලය
தலைமை அலுவலகம்
HEAD OFFICE


තැ. පෙ. අංකය / த. பெ. இல. / P. O. Box No. } 565

234/A3,
ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත,
බත්තරමුල්ල.
234/A3,
டென்சில் கொப்பேகடுவ மாவத்தை,
பத்தரமுல்லை.
234/A3,
Denzil Kobbakaduwa Mawatha,
Battaramulla.

වෙබ් අඩවිය / இணையத்தளம் / Web site } www.rgd.gov.lk


චක්‍රලේඛ අංකය :- 11/2012

දිනය / திகதி / Date: 2012.12.26

චක්‍රලේඛ 11/2012

සියළුම ඉඩම් රෙජිස්ට්‍රාර්වරු වෙත,

## 2013 වර්ෂයේ අයවැය යෝජනා ක්‍රියාත්මක කිරීම
## ලේඛන ලියාපදිංචි කිරීම හා ඇටෝර්නි බලපත්‍ර ලියාපදිංචි කිරීම
## වෙනුවෙන් ගාස්තු මුදලින් අයකිරීම ගිණුම්ගත කිරීම හා වාර්තා කිරීම සම්බන්ධ උපදෙස්

දෙපාර්තමේන්තු චක්‍රලේඛ අංක 10/2012 හා 2012.12.26 දාතමෙන් නිකුත් කල ලේඛන ලියාපදිංචි කිරීම හා ඇටෝර්නි බලපත්‍ර ලියාපදිංචි කිරීම ගාස්තු සංශෝධන ලිපිය අනුව අයකරගනු ලබන මුදල් ගිණුම් ගත කිරීම සම්බන්ධ උපදෙස් මෙ සමග ඉදිරිපත් කරමි.

02. ලේඛන ලියාපදිංචි කිරීම හා ඇටෝර්නි බලපත්‍ර ලියාපදිංචි කිරීම වෙනුවෙන් සියළුම අයකිරීම සඳහා ලි.ප.අ. 86 ආකෘතියේ කුවිතාන්සිය මුදල් ගෙවන අය වෙත නිකුත් කළ යුතු වේ. සෙවීම සහ පිටපත් නිකුත් කිරීම වලට අදාල අයකිරීම සම්බන්ධයෙන් මුදල් ගෙවූ බවට වූ රිසිට්පත් අංකය සමග ගෙවූ මුදල එම අයදුම්පත්‍රවල නිවැරදිව ඇතුළත් කළ යුතු වේ.

03. සියළුම අයකිරීම පොදු 58 අනුව වූ මුදල් පොත් ලැබීම් යටතේ දිනපතා සටහන් කළ යුතු වේ. දිනපතා සියළු අයකිරීම එකතුව පසුදින රෙජිස්ට්‍රාර් ජනරාල් වෙනුවෙන් ලංකා බැංකුව පිටකොටුව ශාඛාවේ පවත්වා ගෙන යන අංක 7041650 දරණ නිල බැංකු ගිණුමට බැර කළ යුතු වේ. මුදල් පොතේ සටහන් කිරීම සම්බන්ධව උදාහරණ සටහනක් මෙ සමග අමුණා ඇත. (ඇමුණුම 01). සමථ මුදල් අයකිරීමද එකම මුදල් පොතේ ඇතුළත් කර බැංකු ගත කිරීම කළ යුතු වේ.

04. සියළුම අය කිරීම සම්බන්ධයෙන් ආදායම වර්ගීකරණ ලේඛණයක් තබා ගත යුතු අතර එහි සාරාංශයක් අමුණා ඇති ආකෘතිය ප්‍රකාරව (ආකෘති 01) එදිනම ප්‍රධාන ගණකාධිකාරී වෙත තැපැල් හෝ අන්තර්ජාලය මගින් එවිය යුතු වේ. තැපැල් මගින් එවන්නේ නම් එහි පිටපතක් 0112-889499 දරණ ෆැක්ස් අංකයට ෆැක්ස් මගින් එවිය යුතු වේ. බැංකු ගත කරන මුදල පෙර දින අයකිරීම් වල එකතුවට සමාන විය යුතු වේ.

1-5

05. සෑම මාසයකම අවසානයේ 'H' අක්ෂර වාර්තාව රජයේ විගණකාධිපති වෙත යොමු කිරීම සඳහා සම්පූර්ණ කර ඊලඟ මාසයේ 5 වෙනි දිනට ප්‍රථම ප්‍රධාන ගණකාධිකාරී වෙත යොමු කළ යුතු වේ. H අක්ෂර වාර්තාවේ පිටපතක් අමුණා ඇත. (ඇමුණුම 02)

එම්.ආර්.එස් තන්දිවීර
ප්‍රධාන ගණකාධිකාරී

අ/ක ඊ. එම්. ගුණසේකර
රෙජිස්ට්‍රාර් ජනරාල්

පිටපත්:-

1. අධ්‍යක්ෂ ජනරාල්, රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තුව
2. භාණ්ඩාගාර නියෝජ්‍ය ලේකම්
3. ලේකම් රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු අමාත්‍යංශය
4. විගණකාධිපති
5. දෙපාර්තමේන්තුවේ සියළුම මාණ්ඩලික නිලධාරීවරු

} දැන ගැනීම හා අවශ්‍ය කටයුතු සඳහා